# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත

[සහතිකය සටහන් කළේ 1974 මැයි මස 23 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

(1974 මැයි මස 31 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන
# පළාත් පාලන සේවා පනත

[සහතිකය සටහන් කළේ 1974 මැයි මස 23 වන දින]

ඇල්.ඩී.—ඕ. 11/73

**පළාත් පාලන සේවයක් සංස්ථාපනය කිරීම සහ විධිමත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයක් සහ පළාත් පාලන සේවා විනය මණ්ඩලයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, එකී මණ්ඩලවල බලතල, කාර්ය හා කටයුතු නිශ්චය කිරීම සඳහා ද, පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා ද, 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත ඉවත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ඒවාට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 16 දරන පළාත් පාලන සේවා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## පළාත් පාලන සේවය

**පළාත් පාලන සේවය සංස්ථාපනය කිරීම සහ ඒ සේවයේ සාමාජිකයන් සම්බන්ධයෙන් අදාළ වන විධිවිධාන.**

2. (1) (මෙහි මින් මතු "සේවය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන සේවය යයි නම් කරනු ලබන සහ හඳුන්වනු ලබන සේවයක් මෙයින් සංස්ථාපනය කරනු ලැබේ.

(2) මෙහි උපලේඛනයේ දක්වා ඇති තනතුරු දරන නිලධරයන් සහ සේවකයන් නොවන මහා නගර සභාවල, නගර සභාවල, සුළු නගර සභාවල සහ ගම් සභාවල මාසික වැටුප් ලබන සියලුම නිලධරයන්ගෙන් සහ සේවකයන්ගෙන් මේ සේවය සමන්විත වන්නේ ය.

(3) මේ පනත ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයෙහි ඉවත් කරන ලද පනතින් සංස්ථාපනය කරන ලද පළාත් පාලන සේවයේ සාමාජිකයකු වූ සෑම තැනැත්තෙක් ම එකී දින සිට, මේ පනත යටතේ සංස්ථාපනය කරන ලද සේවයේ සාමාජිකයකු ලෙස සලකනු ලබන්නේ ය.

(4) සේවයේ සෑම සාමාජිකයෙක් ම දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූල ව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයකු ලෙස සලකනු ලබන්නේ ය.

ජ 03861—13939 (74/05)

(5) සේවයේ සෑම සාමාජිකයෙක් ම රජයේ සේවකයන්ගේ (බැඳීම්) ආඥාපනතේ අර්ථානුකූල ව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය නිලධරයකු ලෙස සලකනු ලබන්නේ ය.

## II වන කොටස

### පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය

පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය පිහිටුවීම.

3. (1) (මෙහි මින් මතු "උපදේශක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයක් මේ පනත යටතේ ඒ මණ්ඩලය වෙත නියම කරනු ලැබිය හැකි බලතල ක්‍රියාත්මක කිරීම, කටයුතු කිරීම හෝ කාර්ය ඉටු කිරීම සඳහා පිහිටුවනු ලැබේ.

(2) ඒ මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වන්නේ ය. ඉන් එක් තැනැත්තකු සභාපති යනුවෙන් නම් කළ යුතු ය.

(3) යම් තැනැත්තෙක්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයෙක් නම්; හෝ

(ආ) යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයෙක් නම්; හෝ

(ඇ) පළාත් පාලන සේවා විනය මණ්ඩලයේ සාමාජිකයෙක් නම්; හෝ

(ඈ) පළාත් පාලන සේවයේ සාමාජිකයෙක් නම්,

ඒ තැනැත්තා උපදේශක මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස තවදුරටත් සිටීමට නුසුදුස්සෙක් වන්නේ ය.

(4) උපදේශක මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු හතරක කාලයක් (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ධුරය දැරිය යුතු ය.

(5) උපදේශක මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුරය—

(අ) ඒ සාමාජිකයා අමාත්‍යවරයා වෙත යවන ලිඛිත දැන්වීමකින් ධුරයෙන් ඉල්ලා අස් වූ විට; හෝ

(ආ) අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට; හෝ

(ඇ) ඒ සාමාජිකයා මිය ගිය විට

හිස් වන්නේ ය.

(6) උපදේශක මණ්ඩලයේ යම් සාමාජිකයකු මිය ගිය හෝ ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කළ යුතු අතර එසේ පත් කරනු ලබන තැනැත්තා, කලින් ධුරය හිස් කළ හොත් මිස, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

(7) උපදේශක මණ්ඩලයේ යම් සාමාජිකයකු රෝගාතුරවීම හෝ අන් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ තම ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙන යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(8) උපදේශක මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය. ඒ පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැයබර කළ යුතු අතර ඔවුන්ගේ ධුර කාල තුළ ඒ පාරිශ්‍රමික අඩු නොකළ යුතු ය.

(9) උපදේශක මණ්ඩලයට ලේකම්වරයකු සිටිය යුතු අතර ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයකු හෝ සේවයේ සාමාජිකයකු හෝ විය යුතු ය. උපදේශක මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයන් රජයේ ස්ථාන මාරු සහිත සේවාවන්ගෙන් හෝ සේවයේ සාමාජිකයන්ගෙන් හෝ පත් කරනු ලැබිය යුතු ය.

(10) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා, උපදේශක මණ්ඩලයේ සභාපති හෝ වෙන යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය. ඒ ඉවත් කිරීම අවසානාත්මක හා තීරණාත්මක වන අතර කිසිම අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතු ය.

(11) තමා පැමිණ සිටින උපදේශක මණ්ඩලයේ සියලු ම රැස්වීම් වල මූලාසනය සභාපති විසින් දැරිය යුතු ය. උපදේශක මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපති නො පැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා ගත් යම් සාමාජිකයකු විසින් එම රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(12) මේ පනතින් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකින් විධිවිධාන සළස්වා නොමැති යම් කරුණක දී උපදේශක මණ්ඩලය විසින් තමන්ගේ කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකි ය.

## III වන කොටස

## පළාත් පාලන සේවා විනය මණ්ඩලය

පළාත් පාලන සේවා විනය මණ්ඩලය පිහිටුවීම.

4. (1) (මෙහි මින් මතු "විනය මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් පාලන සේවා විනය මණ්ඩලයක් මේ පනත යටතේ ඒ මණ්ඩලය වෙත නියම කරනු ලැබිය හැකි බලතල, කටයුතු හෝ කාර්ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම සඳහා පිහිටුවනු ලැබිය යුතු ය.

(2) විනය මණ්ඩලය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනකුගෙන් සමන්විත විය යුතු අතර ඉන් එක් තැනැත්තකු සභාපති යනුවෙන් නම් කළ යුතු ය.

(3) යම් තැනැත්තෙක්—

(අ) ජාතික රාජ්‍ය සභාවේ සාමාජිකයෙක් නම්; හෝ

(ආ) යම් පළාත් පාලන ආයතනයක සාමාජිකයෙක් නම්; හෝ

(ඇ) පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙක් නම්; හෝ

(ඈ) පළාත් පාලන සේවයේ සාමාජිකයෙක් නම්

ඒ තැනැත්තා විනය මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස තවදුරටත් සිටීමට නුසුදුස්සෙක් වන්නේ ය.

(4) විනය මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම ඔහුගේ පත්වීමේ දින සිට අවුරුදු හතරක කාලයක් (5) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව ධුරය දැරිය යුතු ය.

(5) විනය මණ්ඩලයේ සාමාජිකයකුගේ ධුරය—

(අ) ඒ සාමාජිකයා අමාත්‍යවරයා වෙත යවන ලිඛිත දැන්වීමකින් ධුරයෙන් ඉල්ලා අස් වූ විට; හෝ

(ආ) අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට; හෝ

(ඇ) ඒ සාමාජිකයා මිය ගිය විට

හිස් වන්නේ ය.

(6) විනය මණ්ඩලයේ යම් සාමාජිකයකු මිය ගිය හෝ ධුරයෙන් ඉල්ලා අස් වූ හෝ ඉවත් කරනු ලැබූ අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කළ යුතු අතර එසේ පත් කරනු ලබන තැනැත්තා, කලින් ධුරය හිස් කළ හොත් මිස, ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) විනය මණ්ඩලයේ යම් සාමාජිකයකු රෝගාතුර වීම හෝ අන් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර ව සිටීම නිසා හෝ තම ධුරයෙහි කාර්යයන් ඉටු කිරීමට තාවකාලික ව අපොහොසත් වන අවස්ථාවක අමාත්‍යවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවෙන් ක්‍රියා කිරීමට වෙන යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(8) විනය මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය. ඒ පාරිශ්‍රමික ඒකාබද්ධ අරමුදලට වැයබර කළ යුතු අතර ඔවුන්ගේ ධුර කාල තුළ ඒ පාරිශ්‍රමික අඩු නොකළ යුතු ය.

(9) විනය මණ්ඩලයට ලේකම්වරයකු සිටිය යුතු අතර ඔහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයකු හෝ සේවයේ සාමාජිකයකු හෝ විය යුතු ය. විනය මණ්ඩලයේ කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයන් රජයේ ස්ථාන මාරු සහිත සේවාවන්ගෙන් හෝ සේවයේ සාමාජිකයන්ගෙන් හෝ පත් කරනු ලැබිය යුතු ය.

(10) අමාත්‍යවරයා විසින්, කිසිම හේතුවක් නොදක්වා, විනය මණ්ඩලයේ සභාපති හෝ වෙන යම් සාමාජිකයකු ධුරයෙන් ඉවත් කළ හැකි ය. ඒ ඉවත් කිරීම අවසානාත්මක හා තීරණාත්මක වන අතර කිසි ම අධිකරණයක දී එය ප්‍රශ්න නොකළ යුතු ය.

(11) තමා පැමිණ සිටින විනය මණ්ඩලයේ සියලුම රැස්වීම්වල මූලාසනය සභාපති විසින් දැරිය යුතු ය. විනය මණ්ඩලයේ යම් රැස්වීමකට සභාපති නොපැමිණි විටක, පැමිණ සිටින සාමාජිකයන් අතුරින් තෝරා ගත් යම් සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරිය යුතු ය.

(12) මේ පනතින් හෝ මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයකින් විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක දී විනය මණ්ඩලය විසින් තමන්ගේ කාර්ය පටිපාටිය විධිමත් කර ගත හැකි ය.

5. මේ පනත යටතේ ස්වකීය කටයුතු කිරීමේ කාර්යයන් සඳහා විනය මණ්ඩලයට— *මණ්ඩලයේ බලතල.*

(අ) සාක්ෂිකරුවන්ට සිතාසි නිකුත් කර පැමිණෙන ලෙස බල කිරීම පිළිබඳව ;

(ආ) ලේඛන ඉදිරිපත් කරන ලෙස බල කිරීම පිළිබඳ ව ;

(ඇ) යම් සාක්ෂිකරුවන් දිවුරවීම හෝ ඔවුන් ලවා සහතික ප්‍රකාශ කරවීම පිළිබඳ ව

දිසා අධිකරණයකට ඇති සියලු බලතල ඇත්තේ ය.

## IV වන කොටස

## සේවයේ සාමාජිකයන් පත් කිරීම, පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය ආදිය

සේවයේ සාමාජිකයන් පත් කිරීම, පහ කිරීම, ඔවුන්ගේ විනය පාලනය කිරීම ආදී කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයා සතු බලතල.

6. (1) මෙහි මින් මතු සලස්වනු ලබන විධිවිධානවලට යටත් ව, අමාත්‍යවරයා විසින්, සේවයේ සාමාජිකයන් පත් කිරීම, මාරු කිරීම, පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම පිළිබඳ ව වගකිව යුතු අතර ඒ කටයුතු කිරීම සඳහා අමාත්‍යවරයාට බලය ඇත්තේ ය.

(2) සේවයේ සාමාජිකයන් පත් කිරීම, ඔවුන්ගේ ගෙවීම් හා පාරිශ්‍රමික සහ සේවයේ සාමාජිකයන් සඳහා ආචාර සංග්‍රහ පිළිබඳ යෝජනා ක්‍රම සකස් කිරීම ද, සේවයේ සාමාජිකයන් පත් කිරීමේ, මාරු කිරීමේ, මුද හැරීමේ, විශ්‍රාම යැවීමේ, ඔවුන්ගේ තනතුරු අහෝසි කිරීමේ, ඔවුන් සේවයෙන් පහ කිරීමේ සහ ඔවුන්ගේ විනය පාලනය කිරීමේ බලතල ක්‍රියාත්මක කිරීම සහ ඒ බලතල පැවරීම සඳහා වූ කාර්ය පටිපාටිය ද ඇතුළු ව සේවයේ සාමාජිකයන් ට අදාළ සියලු ම කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම ද නිශ්චය කිරීම ද අමාත්‍යවරයා විසින් කළ යුතු ය.

(3) මේ පනතේ සඳහන් කරනු ලැබ ඇති යම් බලතල පැවරීමක් ගැන නොතකා, අමාත්‍යවරයා විසින් සේවයේ සාමාජිකයන් පත් කිරීමේ, මාරු කිරීමේ, මුදා හැරීමේ, විශ්‍රාම යැවීමේ, ඔවුන්ගේ තනතුරු අහෝසි කිරීමේ, ඔවුන් පහ කිරීමේ සහ ඔවුන්ගේ විනය පාලනය කිරීමේ බලතල ක්‍රියාවේ යෙදවිය හැකි ය.

(4) සේවයේ සාමාජිකයන් පත් කිරීම, මාරු කිරීම, මුදා හැරීම, විශ්‍රාම යැවීම, ඔවුන්ගේ තනතුරු අහෝසි කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ ඔවුන්ගේ විනය පාලනය කිරීම පිළිබඳ යම් කරුණක් සම්බන්ධ අමාත්‍ය මණ්ඩලයේ, අමාත්‍යවරයාගේ, පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ, පළාත් පාලන විනය මණ්ඩලයේ, රාජ්‍ය නිලධරයකුගේ හෝ සේවයේ සාමාජිකයකුගේ යම් නිර්දේශයක්, නියමයක් හෝ තීරණයක් පිළිබඳ ව විභාග කර බැලීම, තීන්දුවක් දීම හෝ යම් ආකාරයකින් ප්‍රශ්න කිරීම සඳහා යුක්තිය පසිඳලන කිසිම ආයතනයකට හෝ වෙනත් යම් ආයතනයකට, තැනැත්තකුට හෝ අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් සිය බලතල පවරනු ලැබිය හැකි බව.

7. වර්ෂයකට රුපියල් 6,720 ට අඩු මූලික ඒකාබද්ධ වැටුපක් ඇත්තා වූ සේවයේ යම් තනතුරකට පත් කිරීම පිළිබඳ ස්වකීය බලතල අමාත්‍යවරයා විසින් යම් රාජ්‍ය නිලධරයකු වෙත පදවි නාමයෙන් පවරනු ලැබිය හැකි ය.

උපදේශක මණ්ඩලයේ නිර්දේශයක්.

8. (1) තමා විසින් කළ යුතු පත්කිරීම පිළිබඳ ව උපදේශක මණ්ඩලයේ නිර්දේශය තමා වෙත ලැබී ඇත්නම් මිස, අමාත්‍යවරයා විසින් හෝ එසේ බලතල පවරනු ලැබූ රාජ්‍ය නිලධරයා විසින් සේවයේ සාමාජිකයන් පත් කිරීම පිළිබඳ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම නොකළ යුතු ය.

(2) යම් පත් කිරීමක් සම්බන්ධයෙන් උපදේශක මණ්ඩලයේ නිර්දේශය ඉදිරිපත් කරන ලෙස ඉල්ලන ලද විට, ඒ පත් කිරීම සම්බන්ධ තම නිර්දේශය, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා වෙත හෝ රාජ්‍ය නිලධරයා වෙත ඉදිරිපත් කිරීම උපදේශක මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

අමාත්‍යවරයා විසින් පහ කරනු ලැබීම සහ විනය පාලනය කරනු ලැබීම.

9. විනය මණ්ඩලයේ නිර්දේශය තමා වෙත ලැබී ඇත්නම් මිස අමාත්‍යවරයා විසින් සේවයේ සාමාජිකයන් පහ කිරීම හෝ ඔවුන්ගේ විනය පාලනය කිරීම පිළිබඳ ස්වකීය බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය :

එසේ වුව ද, අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය තමාට ලැබී ඇත්නම් මිස අමාත්‍යවරයා විසින් වර්ෂයකට රුපියල් 14,400 ට නොඅඩු ඒකාබද්ධ වැටුපක් ලබන සේවයේ සාමාජිකයන් පහ කිරීම පිළිබඳ ස්වකීය බලතල ක්‍රියාත්මක නොකළ යුතු ය.

රාජ්‍ය නිලධරයන් විසින් පහ කරනු ලැබීම සහ විනය පාලනය කරනු ලැබීම.

10. (1) වර්ෂයකට රුපියල් 6,720 ට නොවැඩි ඒකාබද්ධ වැටුපක් ලබන සේවයේ සාමාජිකයන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම පිළිබඳ බලතල අමාත්‍යවරයා විසින් පදවි නාමයෙන් යම් රාජ්‍ය නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) පහ කිරීමේ හෝ විනය පාලනය කිරීමේ ස්වකීය බලය අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ පවරනු ලැබ සිටින යම් රාජ්‍ය නිලධරයකු ඒ බලය විනය මණ්ඩලයේ නිර්දේශය නොලබා ක්‍රියාත්මක නොකළ යුතු ය.

අභියාචනා.

11. (1) මේ පනත යටතේ පහ කිරීමේ නියමයකින් අතෘප්තියට පත් සේවයේ යම් සාමාජිකයකුට අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ක්‍රියා පටිපාටියට යටත්ව, ඒ පහ කිරීමේ නියමයට විරුද්ධව අමාත්‍යවරයා වෙත එක් වරක් අභියාචනයක් කිරීමේ අයිතිවාසිකම තිබිය යුතු අතර ඒ පහ කිරීමේ නියමය ස්ථිර කිරීමට හෝ යම් ආකාරයකින් වෙනස් කිරීමට අමාත්‍යවරයාට බලය තිබිය යුතු ය.

(2) අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ඇතිව කරනු ලබන කිසිම පහ කිරීමේ නියමයක්, අමාත්‍ය මණ්ඩලයේ එකඟත්වය ඇතිව මිස, වෙනස් නොකළ යුතු ය.

මුදාහැරීම, මාරු කිරීම ආදියට අදාළ බලතල පැවරීම.

12. සේවයේ සාමාජිකයන් මුදාහැරීම, මාරු කිරීම, විශ්‍රාම යැවීම, ඔවුන්ගේ තනතුරු අහෝසි කිරීම සම්බන්ධයෙන් වූ ස්වකීය බලතල අමාත්‍යවරයා විසින් පදවි නාමයෙන් යම් රාජ්‍ය නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

## V වන කොටස

### සාමාන්‍ය කරුණු

පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවක් පිහිටුවිය යුතු බව.

13. පළාත් පාලන සේවා දෙපාර්තමේන්තුවක් පිහිටුවනු ලැබේ.

පළාත් පාලන සේවා අධ්‍යක්ෂ පත් කිරීම.

14. (1) මේ පනත යටතේ තමා වෙත නියම කරනු ලැබූ හෝ අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයකින් තමා වෙත පවරනු ලැබූ හෝ භාර දෙනු ලැබූ යම් කාර්යයක් හෝ කටයුත්තක් ඉටු කිරීමට පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වශයෙන් හෝ පළාත් පාලන සේවා අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීමට හෝ තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය. පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වශයෙන් හෝ පළාත් පාලන සේවා අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම සඳහා හෝ පත් කරනු ලබන නිලධරයා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සාමාජිකයකු විය යුතු ය.

(2) මේ පනතින් පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත නියම කරන ලද හෝ අමාත්‍යවරයා විසින් ඔහු වෙත පවරන ලද හෝ නියම කරන ලද කටයුතු සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන් සහ වෙනත් නිලධරයන් සහ සේවකයන් යම් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවීම.

15. (1) සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ට විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා ගෙවීම සඳහා පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවා තිබෙන පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල මේ වගන්තිය යටතේ පිහිටුවනු ලබන පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල ලෙස සලකනු ලැබිය යුතු ය.

වැන්දඹු සහ අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදලක් පිහිටුවීම.

16. (1) සේවයේ විශ්‍රාම වැටුප් සහිත සාමාජිකයන්ගේ වැන්දඹුවන්ට සහ දරුවන්ට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා පළාත් පාලන සේවා වැන්දඹු සහ අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවා තිබෙන වැන්දඹු සහ අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදල මේ වගන්තිය යටතේ පිහිටුවනු ලබන පළාත් පාලන සේවා වැන්දඹු සහ අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදල ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථසාධක අරමුදල පිහිටුවීම.

17. (1) සේවයේ විශ්‍රාම වැටුප් රහිත සාමාජිකයන්ට ප්‍රතිලාභ සැලසීම සඳහා පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවා තිබෙන පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල මේ වගන්තිය යටතේ පිහිටුවනු ලබන පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල ලෙස සලකනු ලැබිය යුතු ය.

අරමුදල් පරිපාලනය කිරීම.

**18.** 15 වන, 16 වන සහ 17 වන වගන්ති යටතේ පිහිටුවනු ලබන එක් එක් අරමුදල පිළිබඳ පරිපාලනය මේ පනත ආරම්භ වන දින සිට පළාත් පාලන සේවා අධ්‍යක්ෂ වෙත හෝ තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙන යම් රාජ්‍ය නිලධරයකු වෙත පැවරෙන්නේ ය.

පත් කිරීම්, මාරු කිරීම්, වැටුප්, සහ තනතුරු අහෝසි කිරීම.

**19.** (1) සෑම පළාත් පාලන ආයතනයක් විසින් මේ පනත යටතේ එකී ආයතනයේ යම් තනතුරකට පත් කරන ලද හෝ මාරු කරන ලද සෑම තැනැත්තකුට ම එම තනතුරේ කටයුතු හා කාර්යයන් කිරීමට හා ඉටු කිරීමට සැලැස්වීම සහ කිරීමට හා ඉටු කිරීමට අවසර දීම කළ යුතු අතර, ඒ එක් එක් තැනැත්තාගේ වැටුප් සහ දීමනා ආයතනයේ අරමුදල්වලින් ගෙවිය යුතු ය.

(2) මෙහි උපලේඛනයේ දක්වා ඇති තනතුරක් නොවන යම් පළාත් පාලන ආයතනයක කිසිම තනතුරක්, වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසුව අමාත්‍යවරයාගේ ලිඛිත අනුමතිය ඇතිව මිස ඒ පළාත් පාලන ආයතනය විසින් අහෝසි නොකළ යුතු ය.

පළාත් පාලන ආයතන විසින් පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල, පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල සහ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල සඳහා ගෙවනු ලබන දායක මුදල්.

**20.** මේ පනත යටතේ පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදල හෝ පළාත් පාලන සේවා වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල හෝ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල සඳහා දායක මුදලක් වශයෙන් පළාත් පාලන ආයතනයක් විසින් යම් මුදලක් ගෙවනු ලැබූ විට, ඒ ගෙවීම, ඒ පළාත් පාලන ආයතනය විසින් සුදුසු යක් කරනු ලැබිය හැකි අරමුදල් ඒ පළාත් පාලන ආයතනයේ බලතලවලට අදාළ ලිඛිත නීතිය යටතේ වැය කරනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර එම මුදල, ඉහත කී අරමුදල් අතුරින් යම් අරමුදලක් සඳහා යම් මුදලක් ගෙවීම පැහැර හරින පළාත් පාලන ආයතනයක් සම්බන්ධයෙන් වූ විට, ඒ පළාත් පාලන ආයතනයට ආණ්ඩුවෙන් ගෙවිය යුතු යම් මුදලකින් අඩුකර ගනු ලැබිය හැකි ය.

උපලේඛනය සංශෝධනය කිරීම සහ ප්‍රතියෝජනය කිරීම.

**21.** සේවයේ යහපත උදෙසා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකනු ලබන අවස්ථාවක ඔහු විසින් මේ පනතේ උපලේඛනය නියෝග මගින් සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම හෝ කළ හැකි අතර මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධාන යටතේ ඒ උපලේඛනයෙහි කරන ලද සියලු ම සංශෝධන හෝ වෙනස් කිරීම් ඇතුළත් අලුත් උපලේඛනයක් මගින් ඒ උපලේඛනය කලින් කල ප්‍රතියෝජනය කළ හැකි ය.

දුෂ්කරතා ඉවත් කිරීම.

**22.** මේ පනතේ විධිවිධාන පළමුවරට ක්‍රියාත්මක කිරීමේ දී, මේ පනතින් විධිවිධාන හෝ කාර්යසාධක විධිවිධාන සලස්වා නොමැති යම් කරුණක් හෝ ප්‍රශ්නයක් සම්බන්ධයෙන් යම් සැකයක් හෝ දුෂ්කරතාවක් පැන නැඟුනහොත්, අමාත්‍යවරයා විසින්, ඒ සැකය හෝ දුෂ්කරතාව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් ඉවත් කිරීම හෝ නිශ්චය කිරීම හෝ කළ හැකි ය.

නියෝග සෑදීමේ බලය.

**23.** (1) මේ පනතේ ප්‍රතිපත්ති සහ විධිවිධාන ඉටු කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියෙන් පැවරුණු බලතල වල ව්‍යාප්තියට හානියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සියල්ල හෝ ඉන් යමක් සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:—

(අ) සේවයේ සාමාජිකයන් පත් කිරීම, මාරු කිරීම, මුදා හැරීම, විශ්‍රාම යැවීම, ඔවුන්ගේ තනතුරු අහෝසි කිරීම, ඔවුන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම;

(ආ) 15 වන, 16 වන සහ 17 වන වගන්තිවල සඳහන් එක් එක් අරමුදල පරිපාලනය කිරීම, විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම;

(ඇ) 15 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් අරමුදලෙන් විශ්‍රාම වැටුප් සහ පාරිතෝෂික දීමනා ප්‍රදානය කරනු ලැබීමට සේවයෙහි සාමාජිකයන් සුදුසු කම් ලබන්නේ යම් කොන්දේසි හා අවස්ථාගත කරුණු අනුව සහ යම් සීමා කිරීම්වලට යටත්ව ද, එම කොන්දේසි, අවස්ථාගත කරුණු හා සීමා කිරීම් සහ එම විශ්‍රාම වැටුප් අරමුදල යටතේ එම සාමාජිකයනට කළ යුතු ගෙවීම්;

(ඈ) 16 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් අරමුදල යටතේ විශ්‍රාම වැටුප් ප්‍රදානය කරනු ලැබීමට සේවයෙහි සාමාජිකයන්ගේ වැන්දඹුවන් හා දරුවන් සුදුසුකම් ලබන්නේ යම් කොන් දේසි හා අවස්ථාගත කරුණු අනුව සහ යම් සීමා කිරීම්වලට යටත්ව ද එම කොන්දේසි, අවස්ථාගත කරුණු හා සීමා කිරීම්, සහ එම අරමුදල පාලනය කරන බලධරයා විසින් ද සේවයේ සාමාජිකයන් විසින් ද එම අරමුදලට ගෙවනු ලැබිය යුතු දායක මුදල් නියම කිරීම, එම වැන්දඹුවනට සහ දරුවනට එම අරමුදලින් කළ යුතු ගෙවීම්, එම සාමාජිකයන් ගේ දායක මුදල් ඔවුන්ගේ වැටුප්වලින් අඩු කර ගැනීමට බලය දීම සහ එම අඩු කිරීම් කිරීමේ කාර්ය පටිපාටිය;

(ඉ) 17 වන වගන්තිය යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදල සඳහා දායකයන්ගේ වැටුප්වලින් අඩු කිරීම් කිරීමේ කාර්ය පටිපාටිය;

(ඊ) නියෝග සෑදීමට නියමිත ව ඇත්තේ යම් කරුණු සම්බන්ධ යෙන් ද ඒ සියලු කරුණු.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ එහි ලා නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසුව එළඹෙන දිනයක ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනු මත කරනු නොලැබූ සෑම නියෝගයක් ම එහි අනනුමතියේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ නියෝගයක් එසේ පරිච්ඡින්න වූ ලෙස සැලකෙන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

24. (1) 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම.

(2) ඉහත කී පනත ඉවත් කරනු ලැබුව ද—

(අ) (264 වන අධිකාරය වූ) පළාත් පාලන සේවා ආඥාපනත සහ ඉවත් කරන ලද පනත යටතේ සාදන ලද්දා වූ ද මේ පනත ආරම්භ වූ දිනට ඉහතින් වූ දිනයෙහි බලපැවැත් වූවා වූ ද සෑම නියෝගයක්ම හෝ රීතියක් ම, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන ප්‍රමාණයට, මේ පනත යටතේ සාදන ලද නියෝගයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ ආකාරයෙන් බලපැවැත්විය යුතු ය. තව ද ඒවා මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය ;

(ආ) ඉවත් කරන ලද පනත යටතේ පිහිටුවනු ලැබූ පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉදිරියේ, මේ පනත ආරම්භ වන දිනයට ඉහතින් වූ දිනයෙහි, පවතිමින් තිබුණා වූ යම් විභාගයක් හෝ පැවති වෙනත් කරුණක් අමාත්‍යවරයා විසින් අන්‍යාකාරයකින් විධාන කරනු ලැබුවහොත් හැර, පළාත් පාලන සේවා අධ්‍යක්ෂ විසින් දිගටම පවත්වාගෙන යාම, විභාග කිරීම හෝ නිශ්චය කිරීම කරනු ලැබිය හැකි ය ;

(ඇ) ඉවත් කරන ලද පනතින් වලංගුව තබා ගනු ලැබූ (264 වන අධිකාරය වූ) පළාත් පාලන සේවා ආඥාපනතේ 55 වන වගන්තියෙහි (2) වන උපවගන්තියේ සහ 58 වන වගන්තියෙහි විධිවිධාන තවදුරටත් වලංගුව පවතින්නේ ය.

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"අමාත්‍යවරයා" යන්නෙන් පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා අදහස් වේ ;

"ඉවත් කරන ලද පනත" යන්නෙන් 1969 අංක 18 දරන පළාත් පාලන සේවා පනත අදහස් වේ ;

"පත් කිරීම" යන්න සේවයේ සාමාජිකයන් සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ සාමාජිකයන් උසස් කිරීම ද එයට ඇතුළත් වේ ;

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.

## උපලේඛනය

(2 වන සහ 19 වන වගන්ති)

1. යම් පළාත් පාලන ආයතනයක තාවකාලික හෝ අනියම් ස්වභාවයේ සෑම තනතුරක්.

2. මහා නගර සභාවක සෑම තනතුරක්, ඒ තනතුර සඳහා නියම කර ඇති වැටුප් ක්‍රමයේ උපරිමය වර්ෂයකට රුපියල් 4,000 (ඒකාබද්ධ) නොඉක්මවන්නේ නම්.

3. නගර සභාවක සෑම තනතුරක්, ඒ තනතුර සඳහා නියම කර ඇති වැටුප් ක්‍රමයේ උපරිමය වර්ෂයකට රුපියල් 3,500 (ඒකාබද්ධ) නොඉක්මවන්නේ නම්.

4. සුළු නගර සභාවක හෝ ගම් සභාවක සෑම තනතුරක්, ඒ තනතුර සඳහා නියම කර ඇති වැටුප් ක්‍රමයේ උපරිමය වර්ෂයකට රුපියල් 3,000 (ඒකාබද්ධ) නොඉක්මවන්නේ නම්.